පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක එන්සීපී/2005/04

මගේ අංකය:- එන්සීපී/සීඑස්/පීටී/7
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.
2005.02.05

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
ගණකාධිකාරීවරුන් වෙත.

## වාර්ෂික විසර්ජන ගිණුම් හා අනෙකුත් අවසාන ගිණුම් - 2004

2004 වර්ෂයට අදාල වාර්ෂික විසර්ජන ගිණුම, මුදල් රෙගුලාසි 150 ට අනුකූලව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරීන් තමන්ගේ වැය ශීර්ෂයට අදාල වියදම් සම්බන්ධයෙන් වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙල කොට 2005.03.15 ට පෙර මටද පිටපතක් සහිතව තවත් පිටපත් 2 කින් යුතුව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. මෙම ගිණුම් සකස් කිරීම සම්බන්ධයෙන් 177/2004 හා 22/12/2004 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව නියමිත ආකෘතිවලට අනුකූලව වාර්ෂික විසර්ජන ගිණුම සකස් කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1/73 හා 1973.01.01 සහ 1/74 හා 1974.04.04 දරණ වැය ශීර්ෂ චක්‍රලේඛ ලිපි වල උපදෙස් සැලකිල්ලට ගෙන ඔබේ විසර්ජන ගිණුම පිළියෙල කරන ලෙසත් මෙයින් උපදෙස් දෙනු ලැබේ. 177/2004 දරණ චක්‍රලේඛ ලිපිය හා ආදර්ශ ආකෘතිපත්‍රයේ පිටපතක් මේ සමඟ එවමි.

03.විසර්ජන ගිණුම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් මීට පෙර එවා ඇති විගණන විමසුම් වලට අවධානය යොමු කර එකී වැරදි හා අඩුපාඩු අවමකර ගැනීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමුකරන ලෙසද දන්වා සිටිමි.

04. **<u>අනෙකුත් වාර්ෂික ගිණුම්</u>**

අනෙකුත් වාර්ෂික ගිණුම් සම්බන්ධයෙන් 2002 සැප්තැම්බර් 12 දින නිකුත් කර ඇති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 402 හි සඳහන් විධිවිධාන වලට අනුව 2005.03.15 දින හෝ එදිනට පෙර මටද පිටපතක් සහිතව විගණකාධිපති වෙත පිටපත් 02 කින් යුතුව යැවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

**ජේ.එම්.කරුණාරත්න,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත්:- 1. විගණකාධිපති - දැ.ගැ.ස
2 .අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.පි